The Journal of Archaeology and Heritage Studies (JAHS) 9 (II) 2022: 113-122 pp

JAHS

The Journal of ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# රාජධානි මාරුවත් සමග කුංචුට්ටු කෝරළයේ සිදු වී ඇති සංස්කෘතික පරිවර්තනය පිළිබඳ විමර්ශනයක්

**එස්.ආර්.එල්. සේනානායක**

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, randisenanayaka09@gmail.com

ARTICLE INFO

***Article history:***
Received 20 February 2023
Accepted 29 September 2023
Available online 30 December 2023

**සංක්ෂිප්පය**

මහනුවර රාජධානි සමයේ නව සංස්කෘතික පරිවර්තනයකට ලක් වූ කුංචුට්ටු කෝරළයේ සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික සහසම්බන්ධය පිළිබඳව මෙහි දී අවධානය යොමු කරනු ලබයි. කුංචුට්ටු කෝරළයට අයත් ගම්මානයන්ගේ පැතිරී ඇති පුරාවිද්‍යාත්මක නටබුන්, ශිලාලේඛන සේම ගැමියන් සතු පාරම්පරික ඇදහීම් සිරිත් විරිත් මගින් අනුරාධපුර අවධියේ සිට මහනුවර අවධිය දක්වා හඳුනාගත හැකි ඓතිහාසික සාධක මෙහි දී අධ්‍යයනය කරයි. මූලාශ්‍රය පරිශීලනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය හා සාකච්ඡා ඔස්සේ තොරතුරු රැස්කරගනු ලැබී ය. ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් සොයාගත් සාක්ෂි අතර ප්‍රදේශය පුරා විසිරී ඇති විහාරාරාම නටබුන් සහ ශිලාලේඛන වැදගත් මූලාශ්‍රයයන් විය. ඉපැරණි වාපි සංස්කෘතිය, වෙළදාම, කෘෂිකර්මාන්තය, ඇදහිලි සහ සිරිත් විරිත් ආදිය කාලීනව විපර්යාසයට බඳුන් වූ ආකාරය හා පරිපාලන කටයුතු කෙරෙහි ප්‍රාදේශීය බලපෑම් සම්බන්ධයෙන් මෙහි දී සාකච්ඡාවට බඳුන් වේ. එහි දී අනුරාධපුර රාජධානි සමයේ අගනගරයෙන් පරිබාහිර ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශ පාලනය වී ඇති බව පැහැදිලිව නිරීක්ෂණය විය. එමෙන්ම මහනුවර යුගයේ නැවත ප්‍රතිස්ථාපිත මෙම ප්‍රදේශයේ පැවති කුල සමාජ රටාව සමාජයේ මුල් බැස ගත් ආකාරයත් බුදුදහම ව්‍යාප්ත වීමත් සමඟ ඇති වූ ගම, පන්සල, වැව, දාගැබ යන සංකල්ප සහිතව නිර්මාණය වූ ග්‍රාමීය ජනාවාස මෙම ප්‍රදේශයේ පැවති බවත් හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව ලාංකේය ඓතිහාසික සාධක අනුව යුගයන් දෙකක වෙනස් වූ සමාජ ආර්ථික, දේශපාලන රටාවක් කුංචුට්ටු කොරළයේ පැවති බව අනාවරණය විය.

**මුඛ්‍ය පද: අනුරාධපුර රාජධානිය, කුංචුට්ටු කෝරළය, රාජධානි භුවමාරුව, නුවර කලාවිය**

## 1. හැඳින්වීම

අනුරාධපුර රාජධානියේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් හෙබි නුවරවැව, කලාවැව සහ පදවි වැව යන මහා වාරි නිර්මාණයන්ගෙන් සමන්විත වූ නුවරකලාවිය දිසාවට අයත් හුරුලුගම් පළාතට සීමා වූ පුරාණ කුංචුට්ටු කෝරළය අනුරාධපුර දිස්ත්‍රිකයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වූ ප්‍රදේශයකි. මූලාශ්‍රයාගත තොරතුරු අනුව කුංචුට්ටු කෝරළය පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි වන්නේ 19 වන සියවසේ සිට ය. එසේ වුවද ප්‍රදේශයේ ව්‍යාප්ත වී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ මගින් එම ප්‍රදේශයේ



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

අතීතය හඳුනාගත හැකි වේ. කුංචුට්ටු කොරළයේ ව්‍යාප්ත වී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ ඇති ස්ථාන කිහිපයක් ලෙස හදගල රජමහා විහාරය, හල්මිල්ලවැටිය කලාගම් විහාරය, ගෝනමැරියාව වේරගම රජමහා විහාරය, අයියතීගේවැව ශ්‍රී ශෛලබිම්බාරාමය හා බංඩාර උල්පත විහාරය ආදී ස්ථාන හඳුනාගත හැකිය. වජ්‍රාසන, සඳකඩපහන්, මුරගල්, ස්තූප, බෝධිඝර, බුද්ධප්‍රතිමා මෙන්ම ශිලාලේඛන ආදී වූ පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු අවශේෂ මෙම ප්‍රදේශයේ විසිරී ඇති ආකාරය හඳුනාගත හැකි ය. එම සාධක තුළින් කුංචුට්ටු කෝරළය අනුරාධපුර රාජධානි සමයේ ආරම්භයේ සිට චෝල ආක්‍රමණ හමුවේ අභාවයට යාම තෙක් සමාජ, ආර්ථික, දේශපාලන, ආගමික වශයෙන් වැදගත් භූමිකාවක් නිරූපණය කළ ප්‍රදේශයක් ලෙස දැක්විය හැකි ය. ඉන් පසු පොළොන්නරු රාජධානිය මෙන්ම පසුකාලීනව නිරිතදිගට රාජධානි හුවමාරු වීමේ දී කුංචුට්ටු කෝරළයේ ජනාවාස පැවති බවට නිශ්චිත සාධක මෙතෙක් හමු වී නොමැත. ඒ කෙසේ වෙතත් මුල් කාලයේ සිට මේ ප්‍රදේශය ආශ්‍රිතව ජනාවාස පිහිටුවාගෙන සිටි වන්නියේ ආදිවාසී ජනයා සරල ජීවිතයක් ගත කර ඇත. රාජධානි හුවමාරුවත් සමඟ දිවයිනේ අවසන් රාජධානිය වූ මහනුවර රාජධානි සමයේ දී කුංචුට්ටු කෝරළය නව සංස්කෘතික ආගමනයක් සමඟ ආරම්භ වූ අතර ඒ පිළිබඳ මූලාශ්‍රයගත සාධක ද සාක්ෂි දරයි. එතැන් සිට නූතන අවධියේ සංස්කෘතික රටාව විවිධ සංස්කෘතික සාධක වල සම්මිශ්‍රණයක ප්‍රතිපලයක් ලෙසින් ගොඩනැගුණි. ඒ අනුව පුරාවිද්‍යාත්මක හා ජනප්‍රවාදගත තොරතුරු ආශ්‍රයෙන් මෙරට රාජධානි විතැන් වීමත් සමඟ කුංචුට්ටු කොරළයේ දීර්ඝ කාලීනව ඇති වූ සංස්කෘතික පරිවර්තනය කෙසේද යන්න මෙමගින් අධ්‍යයනය කෙරේ.

## 2. පර්යේෂණ අරමුණ

කුංචුට්ටු කොරළයට අයත් ගම්මානයන් හි පැතිරී ඇති පුරාවිද්‍යාත්මක නටබුන්, ශිලාලේඛන සේම ගැමියන් සතු පාරම්පරික ඇදහීම් සිරිත් විරිත් මගින් අනුරාධපුර අවධියේ සිට මහනුවර අවධිය දක්වා හඳුනාගත හැකි ඓතිහාසික සාධක මෙහි දී අධ්‍යයනය කළ හැකි විය. එහි දී සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික පැතිකඩ තුළ ඇති වූ වෙනස්වීම් සංස්කෘතික පරිවර්තනයක් දක්වා ගමන්ගත් ආකාරය මෙහිදී විමර්ශනයට ලක් කෙරේ. එමෙන්ම අතීත ජනාවාස රටාව, කෘෂිකාර්මික පසුබිම හා වාරි සංස්කෘතිය, ආගමික තත්ත්වය, කුලය මුල්කරගත් සමාජය හා ජනවර්ග ආදිය පිළිබඳ නිගමනවලට එළඹීම සිදුවිය.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයට අදාළ මූලික දත්ත ලබා ගැනීමේ දී අධ්‍යයන ක්‍රමවේද දෙකක් භාවිත කරනු ලැබීය. ඒ පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය යි. පුස්තකාල අධ්‍යයනය යටතේ තොරතුරු ඒකරාශි කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගනු ලැබී ය. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යටතේ පුරාවිද්‍යා අවශේෂ හඳුනාගෙන ගවේෂණය කරන ලද අතර සම්මුඛ සාකච්ඡා මගින් ද තොරතුරු ලබා ගන්නා ලදී. එහි දී අභිලේඛන මූලාශ්‍ර උපයෝගී කර ගැනීම ද සුවිශේෂී විය. එමෙන්ම ප්‍රදේශයේ වැඩිහිටි ප්‍රජාව සමඟ විධිමත් නොවූ සම්මුඛ සාකච්ඡා පවත්වා ඔවුන්ගේ අත්දැකීම්, මතවාද හා ජනප්‍රවාදගත අදහස් විමසා දත්ත රැස්කරගනු ලැබීය.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡාව

මූලාශ්‍ර සාධක මගින් අනුරාධපුර රාජධානියේ මධ්‍ය පාලනය සහ එහි සංස්කෘතික පැතිකඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන අතර එයින් පරිබාහිර ප්‍රදේශ පිළිබඳව කරුණු අනාවරණය නොවේ. ඒ කෙසේ වෙතත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල විහිදීම මත සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික සංදර්භයන් කෙසේ පැවතියේ ද යන්න අවබෝධයක් ගත හැකිය. ජනප්‍රවාදගත තොරතුරු සහ අනෙකුත් මූලාශ්‍රයන් පාදක කරගනිමින් අනුරාධපුර රාජධානිය සේම මහනුවර අවධියේ කුංචුට්ටු කොරළයේ පිහිටීම හා සංස්කෘතික පැතිකඩ පිළිබඳව විමර්ශණයට ලක් කළ හැකිය. ඒ අනුව කුංචුට්ටු කොරළයේ සංස්කෘතික පරිවර්තනය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ප්‍රධාන අවධි 2ක සාධක හඳුනාගත යුතුය.

- අනුරාධපුර රාජධානි සමය
- මහනුවර රාජධානි සමය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

## 4.1 අනුරාධපුර රාජධානි සමය

සාහිත්‍යය මුලාශ්‍රයගත තොරතුරු සළකා බැලීමේ දී අනුරාධපුර අවධියේ මේ ප්‍රත්‍යන්ත ප්‍රදේශය පිළිබඳ තොරතුරු ඉතාමත් අවම වේ. එහෙත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සළකා බැලීමේ දී අභිලේඛනගත සාධක මගින් එහි පැවති දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික පැතිකඩ පිළිබඳ හඳුනාගත හැක. යටත් විජිත අවධියේ දී කුංචුට්ටු කෝරළය නමින් ව්‍යවහර වුවද අනුරාධපුර රාජධානි සමයේ මේ ප්‍රදේශය ලෝලුපලකුලිය බව අභිලේඛන මූලාශ්‍ර "ලොහොලුපැලැ කුළියෙහි" ලෙස දැක්වීමෙන් පැහැදිලි වේ (*I*C. Vol. v, 271p). ඒ බව තහවුරු වන්නේ කුංචුට්ටු කොරළයට අයත් හල්මිල්ලවැටිය, අයියතිගේවැව, බණ්ඩාර උල්පත (ඡායාරූපය 1) යන ටැම් ලිපිවල මෙනමින් මේ ප්‍රදේශය හඳුන්වා ඇති බැවිනි. එමෙන්ම මෙහි ක්‍රි.පු. 3න් වන සියවසේ සිට පරිපාලනමය වශයෙන් යම් දූරාවලියක් පැවති බව විහාරහල්මිල්ලෑව සහ හඳගල පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන සනාත කරයි. එනම් විහාරහල්මිල්ලෑව ලෙන් ලිපියේ (ඡායාරූපය 2) එන "පරුමක සුරින්ද ලෙණෙ" (*I*C. Vol. I, 10p) යන්නෙහි එන පරුමක යන නාම ව්‍යවහරය හඳගල ලිපියේ ද සඳහන් වීමයි. පරුමක බකිනිය වෙළබ ලෙණෙ, පරුමක දතහ ලෙණෙ ශගශ, පරුමක දිගපියික තිසහ ලෙණෙ (*I*C. Vol. I, 10-11pp) යනාදී වූ වශයෙන් ලෙන් ලිපිවල පරුමක නමින් ප්‍රාදේශිය පාලකයන් විශේෂයක් පිළිබඳව සඳහන් කර ඇත. මෙම නාමය පුද්ගල නාමයන් සහිත තනතුරු නාමයක් වශයෙන් හඳුනාගත හැකි ය. එවකට මෙම සමාජයේ සිටි ප්‍රභූ කොට්ඨාසයක් ලෙසින් මොවුන් පාලන කටයුතු ගෙනගොස් ඇත.


එමෙන්ම අගනගරයෙන් විතැන්ව මධ්‍ය පාලනය යටතේ පැවති මෙම ප්‍රදේශයේ පාලන තන්ත්‍රය නමවැනි දසවැනි සියවස්වල වෙනස් ස්වරූපයක් ගෙන ඇති බව ශිලාලේඛන සාධක පෙන්වා දෙයි. එනම් ටැම්ලිපිවල සඳහන් කරනු ලැබූ රජ ප්‍රශස්ති, විරුදාවලි තුළින් රාජවංශික තොරතුරුත්, රාජ්‍ය නිලධාරින් හා ඔවුන්ගේ නිල නාමයන්, පරිපාලන ප්‍රදේශ යනාදිය සඳහන් වීමත් හේතුවෙනි (කුමාර, 1990, 65) හල්මිල්ලවැටිය ලිපියේ iv කස්සප රජුට සිරිසඟබෝ යන උපාධි නාමය භාවිත කිරීම ".....උදා අභය මහරජහු සොහොවුර් කසුබ සිරිසගබො මපුර්මුකා....." (*I*C. Vol. v, 271p) එයට කදිම නිදසුනකි. එමෙන්ම එකල මේ ප්‍රදේශයට රාජ්‍ය නිළධාරින් පැමිණි බවත් ශිලාලේඛන සාක්ෂි මගින් තහවුරු වේ. එනම් රජු මාපා, ඈපා හැරුණකොට වැදගත්ම රාජ්‍ය නිලධාරියා ලෙස 'සෙනවිරද්' හඳුන්වා දිය හැකිය. බදුවලින් නිදහස් කරන ලද රාජකීය ආඥා ප්‍රකාශයට පත් කිරීම ඔහු යටතේ නිලධාරින්ට අයත් වගකීම වු අතර ඒ සඳහා මෙම ප්‍රදේශයට පැමිණි නිළධාරින් පිළිබඳව හල්මිල්ලවැටිය, අය්තිගේවැව හා බණ්ඩාර උල්පත ලිපි තුළ අන්තර්ගත වේ. එම නිළධාරින්ගේ නාමයන් වශයෙන් මුලවඩා සකරා, අතරගලු කොත්තා, (*I*C. Vol. v, 271p) සෙන් සෙනවිරදාණන්, මෙකාප්පර් නමුඩ නිලා, මෙකාප්පර් තිසා සෙන, (*I*C. Vol. v, 324p) මෙකාප්පර් වැදෑරුම් තලා අරක්ක, මෙකාප්පර් තඹගමු කිතිම්, මෙකාප්පර් තිසා වෙහෙර සින්ගි, මෙකාප්පර් නාවිනි කිලින් බොසතිම් (*I*C. Vol. V, 80 p) පෙන්වා දිය හැක. මේ ආකාරයෙන් අනුරාධපුර රාජධානි සමයේ මෙම ප්‍රදේශය තුළ විධිමත් වූ පරිපාලන ක්‍රමවේදයක් පැවති ආකාරය හඳුනාගත හැකිය.

කුංචුට්ටු කෝරළය අනුරාධපුර රාජධානි සමයේ ප්‍රත්‍යන්ත ප්‍රදේශයක් ලෙස ආර්ථික වශයෙන් දියුණු ප්‍රජාවක් වාසය කර ඇති බව ද ශිලාලේඛන මගින් සනාත වේ. ක්‍රි.පු. 3-1 සියවස් අතර කාලයට අයත් හඳගල ලෙන් ලිපි මගින් එය සනාථ වේ. "සිධ පණදක චුඩ- හණෙයක පුත- මජක අබහ ලෙණෙ සග නියතෙ" (*I*C. Vol. I, 10p) යනුවෙන් දැක්වෙන පාඨයට අනුව වාණිජ අධ්‍යක්ෂක වරයෙක් ගැන මෙහි සඳහන් වේ. ඒ අනුව ආර්ථික වශයෙන් වැදගත් නිළධාරි පිරිසක් එකල සිටි බවත්, "නක නකරක වැව හිමි" පාඨය මගින් සමකාලින ප්‍රධාන ජීවන ක්‍රමය වූ කෘෂිකර්මාන්තයට සම්බන්ධ වැව් සඳහා හිමිකරුවන් සිටි බවත් එම ශිලාලේඛන මගින් අනාවරණය වේ (*ibid*, 10p). අනුරාධපුර රාජධානි සමයේම නවය දහය සියවස් අතර කාලයේ මෙම ප්‍රත්‍යන්ත ප්‍රදේශයේ ආර්ථිකය සමෘද්ධිමත්ව පැවති බව හල්මිල්ලවැටිය පරිහාර ලේඛනගත තොරතුරු මගින් අනාවරණය වේ. පරිහාර ලැබු සෑම ගම්බිමකම වැදගත් අංශයක් ලෙස සදහන් වන්නේ ගැල්ගොන්, ගම්ගොන්, ගැල් මීවුන් හා ගෙරියන්ය. කෘෂි ආර්ථික රටාවට හුරුව අද මෙන් යාන වාහන නොවු ඒ සමයේ ගවයා ඉතා වැදගත් වස්තුවක් විය. බඩු ප්‍රවහනය, ගමන්බිමන් යාම, සීසෑම වැනි කෘෂිකාර්මික කටයුතු වලට ද ගවයා මහත් සේ උපකාර


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

කර ගනු ලැබුවේය. එපමණක් නොව ගවයාගෙන් ලබාගත් කිරි හා දිහිකිරි වැදගත් ආහාරයක් විය (කුමාර, 1990, 76) එමෙන්ම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ බදු අයකර ඇති ආකාරය පෙදිව, මග්දිව, මෙලාට්සි වැනි බදුවර්ග වලින් පැහැදිලි වේ (IC. Vol. v, 271p). මේ ආකාරයට මේ ප්‍රදේශය තුළ අනුරාධපුර රාජධානි ආරම්භයේ සිට චෝල ආක්‍රමණ හමුවේ අභාවයට යාම තෙක් විධිමත් ආර්ථික රටාවක් පැවති බව පෙන්වා දිය හැකිය.

එමෙන්ම අනුරාධපුර රාජධානි සමයේ අගනගරයෙන් පරිභාහිර ප්‍රදේශ කරාද බුදුදහම විහිදුනු බවට නිදසුන් වශයෙන් මෙම ප්‍රදේශයෙන් හමුවන සුළුගල් දඹුලු විහාර පරිශ්‍රයේ හා හදගල විහාරයේ ලෙන් ලිපි මඟින් පැහැදිලි වේ. එමගින් ආගමික වශයෙන් වැදගත් වූ සංදිස්තානයක් වශයෙන් එකළ මේ ප්‍රදේශය පැවති බව පෙන්වා දිය හැකිය. එමෙන්ම බ්‍රහ්මණයන් විසූ බවට සාධක වශයෙන් දැක්වෙන ලිපියක් හඳගලින් හමුවේ. "පරුමක බමණහ පුත දනුකය ගුතහ ලෙණෙ සගශ" (IC. Vol. I, 10p) යනුවෙන් දැක්වීමෙන් පැහැදිලි වන්නේ බ්‍රහ්මණ වංශිකයන් පවා භික්ෂූන්ට ලෙන් ආරාම සකසා පුජා කළ ආකාරයයි. ඒ අනුව මෙකල බුදුදහම ප්‍රධාන ලෙසත් බ්‍රහ්මණ වැනි ඇදහිම් අතිරේක වශයෙනුත් ප්‍රදේශයේ තිබීමෙන් සමකාලීන ආගමික නැඹුරුතාවය



සිතියම 1. කුංචුට්ටු කොරළය තදාශ්‍රිත අධ්‍යයන ප්‍රදේශය





ඡායාරූපය 1. බණ්ඩාර උල්පත ටැම් ලිපිය (ඉහළ)
ඡායාරූපය 2. විහාරහල්මිල්ලෑව ලෙන් විහාරය (පහළ)

ගම්‍ය වේ. එමෙන්ම අනුරාධපුර රාජධානි සමයේ අවසාන කාලයේ ප්‍රත්‍යන්ත ප්‍රදේශයේ ආගමික තත්ත්වය අතිශයෙන් වෙනස් ස්වරූපයක් ගත් බව අභිලේඛන සාධක පෙන්නුම් කරයි. ඒ අනුව මෙකල ආරාම, පිරිවෙන්, මෙහෙණිවර ආදිය ගොඩනැගි ඇති ආකාරයක් දක්නට ලැබේ. ඒ බව හල්මිල්ලවැටිය ටැම් ලිපියේ මෙසේ දැක්වෙයි. "එක් සෙවැ අභාගිරි වෙහෙර්හි කුකුළ්ගිරිපෙතැ පිහිටි මගුල් පිරිවෙන" (IC. Vol. v, 271p) යන්න අභයගිරි විහාරයට අයත් පිරිවෙනක් මෙහි පැවති බව ප්‍රකාශ වේ. එමෙන්ම අය්යතිගේවැව ලිපියට අනුව තිසරම් මෙහෙණිවර (IC. Vol. v, 324p) නම් භික්ෂුනින් වහන්සේලා වැඩවාසය කළ ආරාමයක් ප්‍රත්‍යන්ත ප්‍රදේශයේ පැවති බව දැක්වීමෙන් අනුරාධපුර රාජධානිය ආරම්භයේ සිට අවසාන කාලය වන තුරු ආගමික වශයෙන් කැපී පෙනෙන වර්ධනයක් ඇති වී තිබෙන බව අනාවරණය වේ.

මෙරට රාජධානි ආරම්භයත් සමග ගොඩනැගුණු සංස්කෘතිය තුළ කුංචුට්ටු කොරළය ආශ්‍රිත ප්‍රදේශයේ

එවකට පැවති සමාජ පසුබිම සමස්ත රටේම පොදු වූ පංති සමාජ ක්‍රමයක් මුල් බැසගත් ආකාරය මූලාශ්‍ර පිරික්සීමේ දී පැහැදිලි වේ. එනම් අනුරාධපුර රාජධානි සමය තුළ උසස් විධායක තනතුරු දරන නිලධාරීන්, ඔවුන්ගේ අණපනත් ක්‍රියාවේ යෙදවූ නිලධාරීන්, පෞද්ගලික ආරක්ෂක නිලධාරීහු, යුද්ධ භටයෝ, රාජ සභා සේවකයෝ සහ වෙනත් පහත් පෙළේ දාසයෝ (කුමාර, 1990,90) යනාදී පුද්ගලයන් මෙම ප්‍රදේශයේ වාසය කරන්නට ඇති බව අභිලේඛන සාධක පෙන්වා දෙයි. එමෙන්ම සමාජයේ උපාසක උපාසිකා, වැව් හිමියන්, නාවිකයන් වැනි සමාජ ප්‍රභූන් සිටි බව හඳගල ලෙන් ලිපි වල දැක්වේ. ඒ අනුව තමන්ට හිමිව තුබූ කාර්ය කොටස මත සමාජයේ වරප්‍රසාද ලත් නිලධාරි පැළැන්තියක් සහිත පංති රටාවක් පැවති බව පෙනේ.





ඡායාරූපය 3. හල්මිල්ලවැටිය ටැම් ලිපිය (ඉහළ)
ඡායාරූපය 4. හඳගල ලෙන් විහාර සංකීර්ණය (පහළ)

ඒ බව රජකොල් සම්දරුවන්, කැමියන්, වැරියන්, කුඩින් වැනි භාවිතවලින් පෙනේ. විශේයෙන්ම ආරාම සතු විශාල ඉඩම් යායවල් තිබීම නිසා සාමාන්‍ය වැසියන් එවායෙහි ගොවිතැන් කර ලැබෙන අස්වැන්නෙන් ජීවත් වී තිබේ. මෙයින් ප්‍රකට වන්නේ ඉඩම් මුල්කරගත් පංති ක්‍රමයක් මේ කාලයෙත් තිබුණු බවයි (*ibid*, 91p). එසේම මෙකළ ප්‍රධානතම සන්නිවේදන උපක්‍රමයක් වශයෙන් පැවත ඇත්තේ ගල් මත කොටා දැක්වීමයි. ඒ බව මේ ප්‍රදේශය පුරා විහිදී ඇති ලෙන් ලිපි හා ටැම් ලිපි මගින් මනාව පැහැදිලි වේ.

කුංචුට්ටු කොරළයේ අතීත සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ඉවහල් කර ගත හැකි පුරාවිද්‍යාත්මක අවශේෂවලට අනුව අනුරාධපුර රාජධානි සමයේ මේ ප්‍රදේශයේ පැවති සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික පැතිකඩ විවරණය කළ හැකිය. ක්‍රි.පූ. 3න් වන සියවසේ බුදුදහම ලංකාවට පැමිණීමත් සමඟ ඇති වූ බෞද්ධ සංස්කෘතිය තුළ භික්ෂූන් උදෙසා ලෙන් කරවා පූජා කරන්නට විය. ඒත් සමගම මෙරට ලෙන් පරිහරණය කිරීමේ බෞද්ධ සම්ප්‍රදායක් ඇති වූ අතර කුංචුට්ටු කොරළයේ හඳගල රජමහා විහාරය, විහාරහල්මිල්ලෑව සුළුගල් දඹුලු විහාරය, ගල්පියුම ආරණ්‍ය සේනාසනය, උස්ගල වැනි ස්ථාන වලින් එවැනි වූ කටාරම් කොටන ලද ප්‍රමාණයෙන් තරමක් කුඩා හා විශාල වු ලෙන් හඳුනාගත හැකි විය. පසුව මෙම ලෙන් ආරාම වර්ධනය වී ස්තූප නිර්මාණය ආරම්භ වී ඇත. එම ස්තූප සමඟ බුදුපිළිම, සඳකඩපහන්, මුරගල් ආදී වු අංග නිර්මාණය වෙමින් බෞද්ධ සංඝාරාම සම්ප්‍රදායේ ව්‍යාප්තියක් ඇති විය. එත් සමඟ මෙම ප්‍රදේශයේ ගොඩනැගුණු විහාරාරාම කිහිපයකි. ඒ අතර පුරාවිද්‍යාත්මකව වැදගත් විහාරයක් වන්නේ කුංචුට්ටු කොරළයේ 27 තුළානට අයත් හල්මිල්ලවැටිය කළාගම් විහාරයයි. මෙහි අනුරාධපුර රාජධානි සමයේ විවිධ කාල නියෝජනය කරන පුරාවිද්‍යාත්මක අවශේෂ තිබීමෙන් බෞද්ධ සංස්කෘතියේ හා පැරණි තාක්ෂණයේ විකාශණය මැනවින් අවබෝධ කරගත හැකිය. මෙහි තිබෙන බෝධිඝරය ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ පවතින ආකාරයෙන්ම ස්ථානයේ පොළව මට්ටමින් අඩි 10ක් පමණ මාලක දෙකකින් ඔසවා නිර්මාණය කර තිබිණ. එහි බෝධිය රෝපණය කර තිබූ මධ්‍ය චතුරස්‍රාකාර වළ පොළව මට්ටම දක්වා ම නිර්මාණ කර තිබීම විශේෂත්වයකි. (වගලවත්ත, 2012) ඉට අමතරව වජ්‍රාසන, ගල්කණු, පියගැටපෙළ, ස්තූපයක්, පොකුණු ද්විත්වයක්, ටැම් ලිපියක් සහ තවත් නටබුන් විහාර භූමියේ හඳුනාගත හැකිය. එමෙන්ම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කුංචුට්ටු කෝරළයේ 31 තුලානට අයත් බණ්ඩාර උල්පත විහාරයේ ද ටැම් ලිපියක්, සඳකඩපහනක්, බුදුපිළිමයක කොටසක් ආදී වූ නටබුන් පවතී. මෙවැනි ආකාරයේ පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් තහවුරු වන්නේ කුංචුට්ටු කොරළය අනුරාධපුර මුල් අවධියේ සිට චෝල ආක්‍රමණ හමුවේ අභාවයට යාම තෙක් බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වෙමින් පැවති ආකාරයයි.

අනුරාධපුර රාජධානිය චෝළ ආක්‍රමණ හේතුවෙන් බිඳ වැටුනු අතර මෙම ප්‍රදේශයේ තිබූ වෙහෙර විහාර, වැව් අමුණු ද විනාශ මුඛයට පත්විය. ඒ සමග මෙම රාජධානිය අනුරාධපුරයෙන් පොළොන්නරුවටත් පොළොන්නරුවෙන් නිරිතදෙසටත් සංක්‍රමණය වීමෙන් කුංචුට්ටු කොරළයේ තදාශ්‍රිත කළාපය ජනශූන්‍ය වන්නට විය (ගුණපාල, 2022). එහෙත් මේ ප්‍රදේශයේ වනාන්තරගත ශුෂ්ක බිම් පෙදෙස් ආශ්‍රිතව ජනාවාස තනාගෙන වනයෙහි සිටි පිරිසක් දීර්ඝකාලීනව වාසය කර ඇත (කරුණාදාස, 2022). එළු අත්තනගලුවංශයේ ගෝඨාභයගේ කථා ප්‍රවෘත්තියට සම්බන්ධ විස්තරයක අනුරාධපුරයට ආසන්නයේ තැන් තැන්වල වූ වන්නි කැලෑගම් පිළිබඳ සඳහන එම අදහස සාධාරණීකරණය කරයි. ක්‍රි.ව. 15 වන ශතවර්ෂයේ සිට පූජාවලිය (1961, 109) මහාවංසය (1959, 1-16) යන ඓතිහාසික ලේඛනවල නිතර යෙදෙන වන්නි, වන්නිරාජ හා වන්නිවරුන් වැනි යෙදුම්වල අදහස වන්නේ මෙබඳු ප්‍රාදේශිය ප්‍රදේශවල සිටි නායකයන් පිළිබඳව ය. රජරට රාජධානිය බිදවැටිමෙන් හා කාලිංස මාඝගේ ආක්‍රමණයෙන් අනතුරුව නිරිතදිගට ජනසංක්‍රමණය වූ අවධියේ මාඝගෙන් බේරි ඇතැම් ජන කොටස් වනගත ප්‍රදේශවල දිගටම වාසය කළහ. කැළෑබඳව ජීවත් වූ එම ජනයා වන්නි මිනිසුන් ලෙසත් ඔවුන්ට නායකත්වය දුන් පිරිස වන්නිවරුන් ලෙසත් සැලකේ. මේ වන්නියවරු මාඝගෙන් පසුව එම ප්‍රදේශවල ප්‍රාදේශිය නායකත්වය දැරූහ. මෙම වන්නි ජනයා එතැන් සිට බ්‍රිතාන්‍ය පාලන සමය තෙක් මේ ප්‍රදේශවල සරළ දිවිපෙවතක් ගත කලේය (කරුණානන්ද. 1993. v). ඔවුන්ගෙන් පැවත එන්නන් වර්තමානයේ ද කුංචුට්ටු කොරළයට අයත් ගම්මානවල ජීවත් වේ. අනුරාධපුර යුගයේ පරිහානියත් සමග රාජධානි නිරිත දිගට සංක්‍රමණය විමෙන් වියතුන්, වෙළද ශ්‍රේණි, ආගමික නායකයින් වැනි බෝහෝ පිරිස් මේ ප්‍රදේශ හැර යෑමෙන් වැව් අමුණු සිදී, ජනාවාස ගරාවැටෙන්නට ඇත. නිරිතදිගට සංක්‍රමණය වීමෙන් සාහිත්‍ය, කලාව, ආගම වැනි ක්ෂේත්‍රයන්හි නිරතවන්නන් තත්කාලීන මධ්‍ය පාලනය කේන්ද්‍රකරගෙන පමණක් කටයුතු කිරීමෙන් එතැන් සිට මේ ප්‍රදේශය පිළිබඳව සාධක අල්ප විය.

## 4.2 මහනුවර රාජධානි සමය

මෙරට අවසන් රාජධානිය වූ මහනුවර රාජධානි සමයේ දී කුංචුට්ටු කෝරළය වෙත නැවත ජනයා සංක්‍රමණය වූ අතර බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කර ගැනීමෙන් පසුව කුංචුට්ටු කෝරළය එම පරිපාලන රටා අනුව බෙදුණු බව සඳහන් වේ. මෙය සීමා වන්නේ උතුරින් පදවියත්, නැගෙනහිරින් හොරොව්පතානත්, දකුණින් මැදවච්චියත්, බටහිරින් වව්නියා දිස්ත්‍රික් මායිමටත් වේ. මහනුවර අවධියේ දී කුංචුට්ටු කෝරලය අයත් වූයේ නුවර කලාවිය දිසාවේ හුරුලුගම් පළාතට ය. එය නිර්මාණය වන්නේ කඳු වැටියකින් දෙකට බෙදී තිබුණු තරමක් විශාල කල්පේ කෝරළයෙන් කොටසක් වෙන්කොට වීම විශේෂත්වයකි (කරුණානන්ද 1990, 18). මෙසේ ගොඩනැගුණ කුංචුට්ටු කොරළයට එම නම යෙදෙන්නේ දෙමළ භාෂාවේ එන "කුංජුන් බුට්ටු" යන වචනය පාදක කරගනිමින් වන අතර එහි අර්ථය වන්නේ "කුඩා දිය උල්පත් සමූහය" යන්නයි.

චෝල ආක්‍රමණ හමුවේ අනුරාධපුර රාජධානිය අභාවයට යාමෙන් පසු නිරිත දිගට සංක්‍රමණය වූ ජනයා මෙරට අවසාන රාජධානිය වූ උඩරට රාජධානිය බ්‍රිතාන්‍යන් නතුකර ගැනිමෙන් අනතුරුව නැවත වරක් නුවරකලාවිය හා තමන්කඩුව වැනි ප්‍රදේශ කරා පැමිණ පදිංචි වී ඇත. එය සිදු වන්නේ 1818 ඌව වෙල්ලස්ස කැරැල්ල, 1848 මාතලේ කැරැල්ල යනාදියෙන් අනතුරුව බ්‍රිතාන්‍යන්ගෙන් එල්ල වූ තර්ජන වලින් බේරීම සඳහා ය. එසේ පැමිණි උඩරට සිංහල ජනයා කුංචුට්ටු කොරළයට ද පැමිණ පදිංචි වී ඇත. (බන්දුපාල 2022) ඒ පැමිණෙන විට ඔවුන්ට සේවය කළ විවිධ කුල වල ජනයා ද මෙහි පැමිණ පදිංචි වීම මෙම ප්‍රදේශය තුළ කුලභේදය ආරම්භ වීමට හේතු සාධක වී ඇත. එසේ උඩරැටියන් පැමිණෙන විට කුංචුට්ටු කොරළයේ පදිංචි වී සිටියේ වන්නිය වරුන්ය. ඒ වන විට බහුලව කාටුමන්කුලම, ඇටඹගස්කඩ වැනි පැරණි ගම්මාන තම වාසභූමි කරගෙන මෙම ජනයා වාසය කර ඇත (ලයනල් 2022). එමෙන්ම මෙම ප්‍රදේශවල ද්‍රවිඩ ජනයා ද පදිංචි වි සිට ඇති බව පුලියන්කුලම වැනි පැරණි ගම් නාම මගින් පැහැදිලි වේ. කුංචුට්ටු කෝරළයේ නම සැකසී ඇත්තේ ද ද්‍රවිඩ ආභාසයකින් වන හෙයින්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වන්නියවරු සේම ඔවුන් ද මේ ප්‍රදේශවල වාසභූමිකරගෙන සිට ඇත (බන්දුපාල 2022). ඒ අනුව අතීතයේ දී මෙහි සිංහල, වන්නිය සිංහල සහ දෙමළ යන ජන වර්ග ජීවත් වී සිට ඇති බව තහවුරු වේ. පසුකාලීනව මුස්ලිම් ජනයා ද මෙහි පැමිණ පදිංචි වී ඇත.

කුංචුට්ටු කෝරළයේ මෙම ජනයා විසින් තම ආර්ථික තත්ත්වය සකසා ගනු ලැබුවේ කෘෂිකර්මාන්තය මගිනි. රජරට රාජධානියේ පරිහානියත් සමඟ අතහැර දමන ලද වැව් අමුණු නැවත සකසාගෙන පුරන් කුඹුරු අස්වැද්දීම කළ අතර මෙය ප්‍රධාන වශයෙන් සිදුකරන ලද්දේ ගොවි කුලයේ පිරිස් විසින් ය (ගුණපාල 2022). උඩරට සිංහල ජනයා පැමිණීමට පෙර අතුව මෙහි සිටි වනිනිය ජනයා විසින් ප්‍රධානතම ජීවනෝපාය කරගෙන තිබුනේ දඩයම, මසුන් ඇල්ලීම, මී කැඩීම සහ වනාන්තරයේ අල, මුල් එලවැල සොයා යැමයි. සංකීර්ණ නොවූ ජීවිකාවක් ගෙන ගිය ඔවුන් වනාන්තරය කේන්ද්‍රගත කරගනිමින් වාසය කර ඇත. එහෙත් උඩරට සිංහල ජනයාගේ පැමිණීමත් සමග විවිධ වූ වෘත්තීමය පරම්පරාගත කුසලතා පදනම්කර ගනිමින් කුල ක්‍රමය ස්තාපිත විය. එත් සමඟ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය ගොඩනගාගැනීම සිදුකරන්නට විය (කිරිබංඩා 2022). ඒ අනුව කුංචුට්ටු කෝරළයේ සිටි ජනයා තම වෘත්තියට අනුව ගම් නිර්මාණය කරගෙන වාසය කරන්නට විය. ගොවි කුලයේ අය විසින්ම ගව පාලනය කළ අතර බහුතරයක් මොවුන් විය. උඩරට සමාජ ක්‍රමය සේම වැඩවසම් අර්ථ ක්‍රමයක් ක්‍රමයෙන් මෙහි ද ගොඩනැගෙන්නට විය. ඒ අනුව රදා කුලයේ ජනයා රෙදි ඇතිල්ලීමට ද, වහුම්පුර ජනයා හකුරු තැලීම ද, කුඹල් ජනයා වළං සෑදීම ද, රොඩී පිරිස් සිඟමන් යෙදීම ද තම ජීවන වෘත්තිය වශයෙන් බහුලව පැවතිනි (බන්දුපාල 2022).

එමෙන්ම උඩරට පරම්පරාවන් විසින් එතෙක් භාවිත කළ නම් හා වාසගම් වෙනස් කරමින් දෙමළ ආභාෂය යටතේ ඒවා වෙනස්කර ගැනීම සිදුකරන්නට වූ අතර පියාගේ නම මුලට යෙදීම සිරිත විය. ප්‍රදේශයේ පැරණි වාසගම් භාවිත කරන්නන් වර්තමානයේ ද අවම වන අතර සෙල්ලාතේ, යෝගරාජා, ක්‍රිෂ්ණයියා වැනි නම් සහිත වූවන් 20 වන සියවසේ මේ ප්‍රදේශයේ ජීවත් වී තිබන බවද පෙන්වා දිය හැකිය. එමෙන්ම කිරිහාමීගේ රන්එතනා, වන්නිහාමීගේ සුගතපාල වැනි නාම පැවතී තිබේ (ගුණසේන 2022). පුරාණ කුංචුට්ටු කෝරළයේ ශ්‍රම හුවමාරුව සිදු වූ අතර මුදල වැදගත් නොවීය. ඇඳුම්, පැළඳුම්, ලුණු වැනි දෑ ගමටම වෙළඳුන් ගෙ ආ අතර ඒවා ද භාණ්ඩ හුවමාරුවෙන් සිදු විය (කරුණාදාස, 2022) බ්‍රිතාන්‍ය පාලන සමයේ එතෙක් පැවති කුල ක්‍රමය වෙනස් නොවුන අතර කුංචුට්ටු කෝරළයේ පැවති විවාහා හා අවමගුල් උත්සව ආදිය සඳහා වෙනත් වරිගවල පුද්ගයන් ගෙන්වා නොගත්හ (පීරිස්, 1964, 260).

පැරණි කුංචුට්ටු කොරළය තුළ පැවතියේ සරළ සමාජ රටාවකි. පංසල මුල්කරගත් පරිපාලන රටාවත් පසුකාලිනව වරිගසභා ක්‍රමයත් යන ආයතන ඔස්සේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳ පොදු වු විශ්වාස පද්ධතියක් මෙහි ගැබ්ව පැවතිනි. ගමරාල, වෙල් විදානේ, කෝරාළ, උණ්ඩියරාල, අණමැතිරාල ආදී වු ප්‍රාදේශිය නායකයින් ප්‍රදේශයේ ඉහළ ස්ථානයක් ගනු ලැබීය (කිරිබංඩා 2022). උඩරට සමාජ ක්‍රමයේ මෙන් කුංචුට්ටු කොරළය තුළ ද පංසල මුල්කරගත් සමාජ ක්‍රමයක් පැවතිනි. දරුවෙකු මව් කුස පිළිසිදගත් අවස්තාවේ සිට අකුරු කියවීම, නම් තැබීම, වේලපත්කඩය බැලීම, සෙත්පිරිත් කීම, පාංශුකුලය දීම ආදී සෑම කාර්යක්ම පංසල මුල්කර ගනිමින් සිදුකර තිබේ. කුංචුට්ටු කෝරළයේ දක්නට ලැබෙන එකම ටැම්පිට විහාරය ඇත්තේ ගෝනමැරියාව වේරගම රජමහ විහාරයේය. එය මහනුවර රාජධානි සමයේ දී ඉදි කරන්නට යෙදුනේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1751-1782) විසිනි. මෙම විහාරය මහනුවර යුගයට අයත් දේශිය ගෘහ නිර්මාණ ශිල්පයෙන් යුක්තව නිර්මාණය කර ඇති අතර, කැටයම් හා සිතුවම් වලින් ද සමන්විත වේ. එමෙන්ම මූර්ති අතර සිවු බුද්ධප්‍රතිමා, බෝධිසත්ව ප්‍රතිමාවක්, කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ හා ප්‍රාදේශීය පාලක තාමරවැවේ කළුකුමාර මුදියන්සේගේ ප්‍රතිමාව දක්නට ඇත. තවද මෙහි විශ්ණු සමන් දේවාල තිබේ. මෙහි ඇති තවත් විශේෂත්වයක් වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පාලන සමයේ දී මෙම විහාරය තඹ තහඩු සන්නසකින් පුජාකර ඇති බවයි. ඒ අනුව අනුරාධපුරය රාජධානි සමයේ සේම මහනුවර රාජධානි සමයේ ද කුංචුට්ටු කොරළයට රාජ්‍ය මැදිහත්වීම සෘජුවම ලැබී ඇති බව මනාව පැහැදිලි වේ.

කුංචුට්ටු කොරළයේ තදාශ්‍රිත කළාපයේ පැවති ඇදහිලි හා විශ්වාස අතර දේව වන්දනය ප්‍රධාන තැනක් ගනු ලබයි. ඒ අතර පුල්ලෙයාර් දේව වන්දනය, වන්නිය බංඩාර දේව වන්දනය, විෂ්ණු දේව වන්දනය,


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අය්යනායක දේව වන්දනය බහුලව ඇදහීම් සිදුකරනු ලැබේ (බන්දුපාල 2022). එමෙන්ම මුට්ටි නැමීමේ මංගල්‍යය, කිරි ඉතිරවීම වැනි අභිචාර ක්‍රම ද කුංචුට්ටු කොරළයේ අතීතයේ සිට පැවත එන සංස්කෘතික අංගයන් යටතට ගැනේ. මේ ආකාරයෙන් වූ ඇදහිලි විශ්වාසයන් බොහෝමයක් මේ ප්‍රදේශයට ආවේණිකව ගොඩනැගුණ ඒවා වන අතර බොහොමයක් ලක්ෂණ ද්‍රවිඩ ආභාෂය යටතේ දායාද වූ ඒවා ලෙස සැලකේ (බන්දුපාල 2022). එමෙන්ම විහාර හා දේවාල පදනම් කර ගනිමින් අලුත් සහල් මංගල්‍යය, පරණ මංගල්‍යය, දුරුත්තේ මංගල්‍යය හා පෙරහැර කටයුතු සිදුකරනු ලැබේ. විහාරහල්මිල්ලෑව සුලුගල් දඹුලු විහාරයේ හා ගෝනමැරියාව වේරගම රජමහා විහාරයන්හි දේවාල පදනම් කරගෙන එම කටයුතු සිඳු කිරීම අතීතයේ සිට පැවත එන සිරිතකි (ධම්මරක්ඛිත හිමි 2022). මේ ආකාරයට මහනුවර රාජධානි සමය තුළ කුංචුට්ටු කොරළයේ සංස්කෘතික වශයෙන් වැදගත් වෙනස්කම් රාශියක් ඇති වූ බව පෙන්වා දිය හැකිය.



**ඡායාරූපය 5. ගෝනමැරියාව වේරගම රජමහා විහාරයේ ටැම්පිට විහාර ගෙය**

අනුරාධපුර අවධියේ සංස්කෘතික පැතිකඩ පිළිබඳව ශිලාලේඛන සාධක බහුල වන නමුත් මහනුවර අවධියේ දී සාහිත්‍යමය හා ජනප්‍රවාදගත තොරතුරු මත ඓතිහාසිකත්වය විවරණය වේ. එමෙන්ම චෝල ආක්‍රමණ, දේශපාලන හා ආර්ථිකමය අස්ථාවරත්වය වැනි හේතු නිසා නිරිතදිග ප්‍රදේශ කරා පැමිණි ජනයා නැවත වරක් යටත්විජිත පාලකයින්ගේ බලපෑම හමුවේ මේ ප්‍රදේශ කරා පැමිණීම මත පෙනියන්නේ ලාංකිකයන් එදා සිටම බොහෝ විදේශීය බලපෑම් වලට ලක් වූ බවයි. අනුරාධපුර යුගයේ මේ ප්‍රදේශයේ ජන ජීවිතය සංකීර්ණ වුව ද මහනුවර අවධිය වන විට මේ ප්‍රදේශයේ ජනයා වැවත් ගමත් මුල්කරගත් සරළ ජීවිතයක් ගතකර ඇත. විශේෂයෙන්ම රජරට රාජධානි අවධියේ ශිල්ප ශ්‍රේණි මුල් වූ රාජකාරි ක්‍රමයක් පැවතුණ ද මහනුවර අවධිය වන විට කුලය පදනම් කරගත් සමාජ ධූරාවලියක් පැවතීම සංස්කෘතිකමය පරිවර්තනයට කදිම නිදර්ශකයකි. හීනයාන, මහායාන, ජෛන, බ්‍රහ්මණ වැනි ඇදහිලි මුල්කාලීනව පැවතිය ද යටත්විජිත කාලය වන විට පංසල මුල් වූ සරළ ඇදහීමත් වැව මුල් වූ දේව වන්දනයත් ප්‍රචලිත වීම දැකිය හැක. මේ ආකාරයට කුංචුට්ටු කොරළයේ සිදුවූ සංස්කෘතික වෙනස්වීම් වල විකාශණය හඳුනාගත හැක.

## 5. සමාලෝචනය

කුංචුට්ටු කෝරළයේ සංස්කෘතික පරිවර්තනය සමාජ පුරාවිද්‍යාත්මක දෘෂ්ටියෙන් විමසීමේ දී පුරාවිද්‍යාත්මක හා ඓතිහාසිකමය සාධක පිළිබඳව විමසා බැලිය යුතුය. ඒ අනුව මහනුවර රාජධානි සමයේ මෙරට පරිපාලන රටාව තුළ ස්ථාපිත නුවර කලාවිය දිසාවනිය යටතේ පාලනය වූ කුංචුට්ටු කෝරළයේ යුගයන් දෙකක ඇති වූ සංස්කෘතික පරිවර්තනය හඳුනා ගැනීම මෙමඟින් සිදු කරන ලදී. ප්‍රත්‍යන්ත ප්‍රදේශය අධ්‍යයනයේ දී අනුරාධපුර රාජධානියේ සේම ඉන් පසුවත් රාජධානි හුවමාරුව සමඟ දේශපාලනය, ආර්ථිකය, සමාජ, ආගමික පැතිකඩයන්ගේ වෙනස්කම් රාශියක් ඇති විය. ක්‍රි.පු 3න් වන සියවසේ බුදුදහමේ පැණීමත් සමඟ ගොඩනැගුණ බෞද්ධ සංස්කෘතිය මේ ප්‍රදේශයේ ද ස්ථාපිත වූ ආකාරය පුරාවිද්‍යාත්මක සාධක තුළින් මනාව පැහැදිලි වේ. එහි දී ලෙන් ආරාම සම්ප්‍රදායක් ගොඩනැගුනි. පරුමක වැනි ප්‍රාදේශිය නායකයන්, වාණිජ අධ්‍යක්ෂකවරු, නාවිකයන් සමාජයේ මුල් තැනක් ගත් පිරිසක් ලෙස ප්‍රත්‍යන්ත ප්‍රදේශය තුළ සිටි බවත් භික්ෂු, භික්ෂුණි, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස විසින් කළ ලෙන් පූජාවන් ද සමකාලීනව පැවති බෞද්ධ සම්ප්‍රදාය මැනවින් නිරූපණය වේ. සියවස් කිහිපයක් යන විට ප්‍රදේශයේ ලෙන් ආරාම සම්ප්‍රදාය දියුණු වී සංඝාරාම සම්ප්‍රදායක් ස්ථාපිත වූ අතර කලාව, ගෘහනිර්මාණ ශිල්පයේ වර්ධනයක් ඇති විය. ඒ බව හල්මිල්ලවැටිය කලාගම් විහාරය, බණ්ඩාර උල්පත විහාරය, හඳගල රජමහ විහාරය, විහාර හල්මිල්ලෑව සුලුගුලු දඹුලු විහාරය, අයියතිගේවැව ශෛලබිම්බාරාමය, හේරත්හල්මිල්ලෑව රජමහ විහාරය වැනි විහාරයන්ගේ දක්නට ලැබෙන පුරාවිද්‍යා නටබුන් සාක්ෂි දරයි.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සඳකඩපහන්, මුරගල් හා පියගැට පේළි වැනි අනර්ඝ නිර්මාණ මගින් ප්‍රකට කෙරෙන්නේ සමාජයේ එවකට තිබූ ශිල්ප කර්මාන්ත වල ප්‍රගමනයයි. ලෝකුරුවන්, ගල් වඩුවන්, වෙළෙන්දන්, රාජ්‍ය නිළධාරින් සේම විවිධ අංශ නියෝජනය කළ පිරිස් කුංචුට්ටු කෝරළයේ ප්‍රත්‍යන්ත ප්‍රදේශය තුළ අනුරාධපුර අවධිය තුළ සිටි බව මින් ගම්‍යමාන වේ. රාජ්‍ය නියෝග නිසි පරිදි ජනතාව වෙත සන්නිවේදනය කිරීම උදෙසා ලෙන් ලිපි වර්ධනය වු අතර ඒ සඳහා බ්‍රහ්මී අක්ෂර කලාවේ විකාශණය ද ඉවහල් විය. කුඩා වැව් ඉදිකිරීම, ස්තූප නිර්මාණකරණය, බෝධිඝර ඉදිකිරීම, වජ්‍රාසන නිර්මාණය, පොකුණු සැකසීම වැනි දෑ සඳහා යොමු වූ මුල් කාලින මිනිසා බෞද්ධ සංස්කෘතියක් යටතේ පෝෂණය වූ සමාජ, ආර්ථික, දේශපාලන භූමිකාවක් නිරූපණය කරන ලදී. වර්ෂ 1400කට අධික කාලයක් මුළුල්ලේ මානව මැදිහත්වීමකට ලක් වූ කලාපයක් වශයෙන් කුංචුට්ටු කෝරළ ප්‍රත්‍යන්ත ප්‍රදේශයේ දීර්ඝකාලීන සංස්කෘතික වෙනස්කම් චෝල ආක්‍රමණ හමුවේ අභාවයට යන්නට විය. ඒත් සමග අනුරාධපුරයෙන් නිරිතදිගට රාජධානි හුවමාරුවීම ආරම්භ විය. මේ සමඟ මෙහි සිටි ජනයා තම ජීවත පැවත්ම සහතික කර ගැනීම උදෙසා ඒ ඒ ප්‍රදේශ කරා විතැන් විය. එහෙත් කාලාන්තරයක් මුළුල්ලේ වනාන්තරය තම ජීවිකාව කොට ගත් වන්නියර්වරු මේ ප්‍රදේශයේ අඛණ්ඩවම තම වාසස්ථාන ඉදිකරගනිමින් දඩයම් ජීවිතයක් ගත කරන්නට විය. එසේ නිරිත දිගට රාජධානි හුවමාරුවත් සමඟ මේ කළාපය පිළිබඳව විමසා බැලීමට පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික සාධක හමුවන්නේ නැත.

එහෙත් නැවත වරක් බ්‍රිතාන්‍ය පාලන සමය තුළ උඩරට සිංහල ජනයා විසින් ජනාවාස ආරම්භ කරන්නට විය. ඒ වන විට මහනුවර රාජධානියට අයත් ඒකකයක් ලෙස කුංචුට්ටු කොරළය වන්නියර්වරුන්ගේ පාලනය යටතේ පැවතිනි. දෙමළ ආභාෂයත් සමඟ නිර්මාණය වූ සංස්කෘතියක් පැවති කුංචුට්ටු කොරළයේ උඩරට සිංහල, දෙමළ, වන්නියර්වරුන්, රදා, හකුරු, බඩහැල, රොඩී වැනි ජනවර්ග පදිංචි වී සිටි අතර උඩරට පැවති කුළ ක්‍රමය එසේම මෙහිද පැවතිනි. පසුකාලීනව වෙළඳාමේ පැමිණි යෝනකවරු ද මෙහි පදිංචි විය. ආචාරධර්ම, සිරිත්විරිත්, ඇදහීම්, ඇදහිලි ප්‍රදේශයට ආවේණික ලෙස ගොඩනැගුන අතර අනුරාධපුර යුගයේ සේම බෞද්ධ සංස්කෘතියට මුල් තැනක් හිමි වුව ද දේව වන්දනය ඉතාමත් ප්‍රචලිත විය. බෞද්ධ විහාරාරාම තුළ දේවාල ඉදිකිරීම, පුල්ලෙයාර්, වන්නිය බංඩාර හා විෂ්ණු වැනි දෙවියන් ඇදහීම මෙන්ම පෙරහැර පැවත්වීම, අලුත් සහල් මංගල්‍යය පැවත්වීම යනාදී සංකල්පයන් බුදුදහමත් හින්දු ආගමික සහසම්බන්ධතාවන් පිළිබඳ අදහසක් ඉදිරිපත් කරන අතර, බොහෝ විශ්වාස අස්පර්ශිත උරුමයන් ලෙස කැපී පෙනෙයි. ඉතා දීර්ඝ කාලයක දී කුංචුට්ටු කෝරළේ වැසියන් හේන් සහ වී ගොවිතැන පදනම් කර ගනිමින් ජීවිකාව ගෙන ගියහ. ගම් සභා මගින් පාලනය වූ පැරණි කුංචුට්ටු කෝරළය අනුරාධපුර අවධියේ විනාශ වූ වැව්, පුරං වූ කුඹුරු අස්වද්දා තම දිවි පැවත්ම සහතික කර ගත්හ. අනුරාධපුර රාජධානි සමයේ මානව මැදිහත්වීම් සිදු වූ ප්‍රදේශයක් වශයෙන් මහනුවර අවධිය වන විට කුංචුට්ටු කොරළයේ ඇති වූ සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික වෙනස්වීම් සෘජුව ම සංස්කෘතික පරිවර්තනයක් දක්වා ගමන් ගත් බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත මූලාශ්‍රය


- තිස්ස කුමාර. ආනන්ද, (1990) ***පැරණි ලක්දිව අත්තාණි ප්‍රධාන විධි***, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැළණිය.
- පීරිස්, රැල්ෆ් (1964), ***සිංහල සමාජ සංවිධානය***, විහිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.
- පෞරාණික ලංකිය උරුමයන්, ***අනුරාධපුරය සහ මිහින්තලය*** (2012) වගලවත්ත.තුසිත, මහාවිහාරය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
- යු. කරුණානන්ද, (1993), ***තමන්කඩුව***, 1815-1900, කර්තෘ ප්‍රකාශණයකි.
- Paranavitana, Senarath. (1970) ***Inscriptions of Ceylon (Volume 1),*** Department of Archaeology, Sri Lanka.
- Ranawella. Sirimal, ***Inscription of Ceylon, vol. V¸ Part I***¸ Dipartment of Archaeologey¸ 2001.
- Ranawella. Sirimal¸ ***Inscription of Ceylon, vol V¸ Part II***¸ Dipartment of Archaeologey¸ 2004



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

*සම්මුඛ සාකච්ඡා*

– ධම්මරක්ඛිත හිමි, විහාර හල්මිල්ලෑවේ. (අවු. 90) විහාරාධිපති සුළුගල් දඹුළු පිරිවෙන් විහාරය, විහාර හල්මිල්ලෑව, 2022.01.27.

– කරුණාදාස, එන්. (අවු. 75) වෙද මහතා, කණුගහවැව, හල්මිල්ලවැටිය, කැබිතිගොල්ලෑව 2022.01.27.

– කිරි බංඩා, (අවු. 64) ගොවි මහතා, තිත්තගෝනෑව, කැබිතිගොල්ලෑව 2022.01.27.

– බන්දුපාල, යූ. (අවු. 74) කපු මහතා, කණුගහවැව, හල්මිල්ලවැටිය, කැබිතිගොල්ලෑව 2022.01.25.

– ඩබ්ලිව්. ගුණපාල, (අවු. 72) ගොවි මහතා, තිඹිරිවැව, කැබිතිගොල්ලෑව 2022.01.30.

– ලයනල්, (අවු. 70) ගොවි මහතා, කණුගහවැව, හල්මිල්ලවැටිය, කැබිතිගොල්ලෑව 2022.01.20.

– ඩබ්ලිව්. ගුණසේන (අවු. 59) ගුරුවරයා, හල්මිල්ලවැටිය, කැබිතිගොල්ලෑව 2022.02.01.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk